# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2035/3 - 2017 සැප්තැම්බර් මස 4 වැනි සඳුදා - 2017.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට රත්මලාන-මොරටුව අප ජල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති අදියර II යටතේ අංක : 10 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යවී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 අගෝස්තු මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1264

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 546බී විහාර-ග්‍රාම නිලධාරී වසමේ රත්මලාන ගමේ පිහිටි දිසානායක වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 11ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඇල රක්ෂිත පාර ; |
| *නැගෙනහිරට* | : | ඇල රක්ෂිත පාර ; |
| *දකුණට* | : | දිසානායක වත්ත පාර ; |
| *බටහිරට* | : | එම්. දිසානායක මහතා හිමිකම් කියන අංක 133/15 ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : සොයාගත නොහැක.
(විදේශගතව ඇත)

09 -434

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට රත්මලාන-මොරටුව අප ජල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති අදියර II යටතේ අංක ඃ 11 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යවී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 අගෝස්තු මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1265

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 547 අඟුලාන උතුර - ග්‍රාම නිලධාරී වසමේ අඟුලාන ඩයස් පෙදෙස ගමේ පිහිටි අංක 19A දරන සිමෙන්ති වැඩපලට යාබද ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 68ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | රම්‍යා සුභාෂිනී මිය හිමිකම් කියන අංක 320 ඉඩම ; |
| *නැගෙනහිරට* | ඃ | රම්‍ය නදිය පාර ; |
| *දකුණට* | ඃ | මහින්ද සිල්වා මයා හිමිකම් කියන අංක 19A දරන සිමෙන්ති ගල් වැඩපල ; |
| *බටහිරට* | ඃ | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* ඃ සොයාගත නොහැක.
(විදේශගතව ඇත)

09 -435

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.